# යාපහුවේ ශෛලමය කැටයම් කලාව

එස්. එන්. බුද්ධිකා
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
nishadibuddika@gmail.com

**සංක්ෂේපය**

සුභ බලකොටුව නමින් ප්‍රකට යාපහුව මුලින්ම ඉදිකරන ලද්දේ සුභ නම් සෙන්පතියෙකු විසිනි. ඉන්පසු රාජධානියක් වශයෙන් පැවතුණු මෙහි අද ශේෂව පවතින රජ මාලිගයේ හා දළදා මැදුරෙහි නටඹුන් අතර සුවිශේෂී ගල් කැටයම් රාශියක් දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ යාපහු යුගයේ දක්නට ලැබෙන ශෛලමය කැටයම් කලාව හා ඒවාට ආභාසය ලත් අනෙකුත් කලා සම්ප්‍රදායන් පිළිබඳවත් කැටයම් නිර්මාණ තුළින් හෙළි වන සමකාලීන සමාජය පිළිබඳවත් විමර්ශනය කිරීමයි. මෙම අධ්‍යයනයේ දී පුරාවිද්‍යාත්මක හා ප්‍රාථමික මෙන්ම ඊට අදාල ද්විතීය මූලාශ්‍රය ද භාවිතයට ගන්නා ලදී.

සොයාගත් නෂ්ටාවශේෂ අතර දැනට කොළඹ කෞතුකාගාරයේ ඇති ශෛලමය කැටයම් පුවරුව සුවිශේෂී වේ. මෙය ග්‍රිල් රටාවකින් යුක්තය. මෙහි මධ්‍යයෙහි ඉතා කුඩා සිංහ, ගජසිංහ, හංස, වාමන හා රඟන රූ කැටයම් කොට ඇත. එකල සිවුමැදුරු කවුළුවක් ලෙස භාවිත වූ මෙම කැටයම් පුවරුවට සමානකම් දක්වන වාතාශ්‍ර පුවරු අග්‍රාහි ටජ්මහලෙහි දක්නට ඇත. පැරණි ලංකාවේ කිසිම තැනක මේ හා සමාන කැටයම් දක්නට නොමැති බැවින් කෞතුක වස්තුවක් ලෙස මෙහි අගය කිව නොහැකි තරම්ය. යාපහු දළදා මන්දිරයට අයත් අඩිතාලමෙහි දැක්වෙන වාදන පෙරහැරද එකල දෛනික ජීවිතයේ තතු කියාපාන විශේෂ කලා කෘතින්ගෙන් එකකි. මෙම රූප පේළිවල වැඩිදෙනෙක් ස්ත්‍රීහු වෙයි. ඇතැම් අය කරනම් ගසන්නන් ලෙස දක්වා ඇත. මෙහි දැක්වෙන සංගීත භාණ්ඩ අතර පිඹින නළා, කයිතාලම්, බෙර සහ අත්තාලම් ආදිය වේ. නටන්නන්ගේ නර්තන විලාශය සජීවී බවක් දක්වයි. යාපහුවේ දොරටු කැටයම් අතර මුදුනේ ඇති මන්දිරයෙහි ඉදිරිපිට ඝන ගලින් කපන ලද කැටයම් සහිත උළුවස්ස වැදගත් වේ. එහි දෙපස වූ කවුළු දෙක මුදුනෙහි දේව රූප මැදිකොට නිමවන ලද කැටයම් පුවරු දෙකක් දක්නට ලැබේ.

මෙම කලා නිර්මාණ දෙස අවධානය යොමු කිරීමේදී හෙළ ගල් වඩුවාගේ දක්ෂතාවයත්, දකුණු ඉන්දීය කලා සම්ප්‍රදායන්හි ආභාසයත්, සමකාලීන සමාජය පිළිබඳවත්, යම් අවබෝධයක් ලබා ගත හැකිය.

**ප්‍රමුඛ පද:- යාපහුව, ගල් කැටයම්, නිර්මාණශීලීත්වය, සම්ප්‍රදායයන්, ආභාසය**